# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1936/51 - 2015 ඔක්තෝබර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2015.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම,

(අ) ඉහත කී ව්‍යවස්ථාව ප්‍රකාර අමාත්‍ය මණ්ඩලයෙහි අමාත්‍යවරුන් සංඛ්‍යාව නිශ්චය කරනු ලදුව ;

(ආ) 2015 සැප්තැම්බර් මස 21 දිනැති අංක 1933/13 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයේ සඳහන් විෂයයන් හා කාර්යයන් එකී අමාත්‍යවරුන්ට පවරන ලදුව ;

(ඇ) ඉහත සඳහන් නිවේදනයේ උපලේඛනය මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබ අති බව මෙයින් නිවේදනය කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2015 ඔක්තෝබර් මස 14 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි ප්‍රවාහන අමාත්‍ය (අංක 7) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-
(අ) එම ශීර්ෂය ''(7) ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය'' වශයෙන් ;

(2) එම නිවේදනයෙහි නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය (අංක 18) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-
(අ) එහි II වැනි තීරුවෙහි දක්වෙන 9 සහ 13 අයිතමයන් ඉවත් කිරීමෙන් ;
(ආ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන ''ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන පනත (1995 අංක 29) '' ඉවත් කිරීමෙන් ;

(3) එම නිවේදනයෙහි විශ්වවිද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය (අංක 11) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-
(අ) එම ශීර්ෂය ''(11) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය'' වශයෙන් ;
(ආ) එහි II වැනි තීරුවෙහි 7 වැනි අයිතමයට පසුව පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් :-
''8. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) හා ඊට අනුබද්ධිත සියළුම තොරතුරු තාක්ෂණ ආයතන
9. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය'' ;
(ඇ) එහි III වැනි තීරුවෙහි ''මාර්ග සංවර්ධන අධිකාරිය පනත (1981 අංක 73)'' යන්නට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් :-
''ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන පනත (1995 අංක 29)''

10 - 1139

1A - G 22494 — 431 (2015/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.